# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2454/40 – 2025 සැප්තැම්බර් මස 17 වැනි බදාදා – 2025.09.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/03/2020/235

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.07.21 දිනැති හා අංක 2446/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.07.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 05,ටොරින්ටන් මාවත, ටොරින්ටන් මහල් නිවාස, ජී 55 ලිපිනයෙහි පදිංචි කේ. ඒ. එන්. ප්‍රේමසිරි මයා සහ කොළඹ 07, නිදහස් චතුරස්‍රය ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/ 41/2025 හා 2025.08.21 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 45400 – 18(2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

නඩු අංකය: A/41/2025
යොමු අංකය: IR/COM/03/2020/235

1. කේ. ඒ. එන්. ප්‍රේමසිරි මයා,
ජී 55
ටොරින්ටන් මහල් නිවාස,
ටොරින්ටන් මාවත,
කොළඹ 05

*පළමු පාර්ශ්වය*

2. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07. *දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ආචාර්ය කේ. ඒ. තිලකරත්න වන මා පත් කර ඇත. ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

“ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අතිරේක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරමින් සිට 2018.06.20 දින විශ්‍රාම ගිය කේ. ඒ. එන්. ප්‍රේමසිරි මහතාට පහත සඳහන් කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද? යන්නත් පිළිබඳව වේ.

1. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් MM 1-1 වැටුප් පියවරේ සිට HM වැටුප් පියවරේ පිහිටුවන ලද 2018.05.14 දින සිට කේ. ඒ. එන්. ප්‍රේමසිරි මහතා විශ්‍රාම ගිය 2018.06.20 දින දක්වා කාලය සඳහා හිඟ වැටුප් හා දීමනා හිමි ද යන්නත් හිමිනම් එය ලබා නොදීම.

2. වෘත්තීය දීමනා හිඟ මුදලක් තිබේ ද යන්නත් තිබේ නම් එය ලබා නොදීම.” වේ.

මෙම කාර්මික ආරාවුලට පූර්ව බේරුම්කරුවකු වෙත යොමුකර තිබූ අතර, 2022.09.28, 2022.10.25, 2022.12.14, 2023.07.21, 2024.04.10, 2024.05.06, 2024.08.05, 2024.08.15, 2024.09.25, 2024.10.28, 2024.11.21, 2024.12.30 වැනි දිනවල නඩුකරය පවත්වාගෙන ගොස් ඇත. එමෙන්ම පූර්ව බේරුම්කරු තම පෞද්ගලික හේතුන් මත 2025.03.11 දින ඉල්ලා අස්වීමට හේතුවෙන් නඩුකරය නව බේරුම්කරු වන මා වෙත යොමු වී තිබේ.

2025 අගෝස්තු 11 දින නව බේරුම්කරු ඉදිරියේ නඩුකරය කැඳවන ලදී. ගරු බේරුම්කරණ අධිකරණය වෙතින් සහන ඉල්ලා නඩුකරය පවතින අතරතුර ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් නඩුකරයක් අංක 327/2015 යටතේ යොමු වී තිබුණි. එහි තීන්දු ප්‍රකාශය 2025 අගෝස්තු 11 දින දෙවන පාර්ශ්වය විසින් බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත.
දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥ යසස් තිලකරත්න මහතා ගරු බේරුම්කරණ අධිකරණයේදී පහත සඳහන් පරිදි කරුණු දක්වන ලදී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් අද දින ප්‍රකාශ කර සිටින්නේ මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇති යොමුවේ සඳහන් කරුණු පිළිබඳව මේ වන විටත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මූලික අයිතිවාසිකම් නඩු අංක 327/ 2015 යන 2025.08.05 දිනැතිව අවසානාත්මක තීරණයක් ගෙන ඇති බවය. මෙම ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ 12 වන වග උත්තරකරු ලෙස මෙම බේරුම්කරණයේ පළමු පාර්ශ්වයේ නම සඳහන් වේ. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇති නඩුව සම්බන්ධයෙන් සහභාගී වීමට සහ කරුණු දැක්වීමට මෙම පළමු පාර්ශ්වයට එහිදී ද ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙන් නියම කර ඇති ආකාරයට මෙම බේරුම්කරණය ඉදිරියේ මතුව ඇති ප්‍රශ්නගත සිද්ධිය සම්බන්ධව සහන ලබාදෙනවා නම් එය සහන ලබාදීමේ හැකියාව මෙම බේරුම්කරණයට මේ වන විට නැති බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටී. ඒ අනුව තවදුරටත් බේරුම්කරණය ඉදිරියේ ඇති මෙම යොමුවට අදාළ කාරණාව ඉල්ලුම්කරුහට පවරා පවත්වාගෙන යාමට හැකියාවක් නොමැති බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටී. ඒ අනුව මෙම ශ්‍රේෂ්ඨාෂිකරණ නඩු තීන්දුව සැලකිල්ලට ගනිමින් මෙම බේරුම්කරණයට අදාළ අවසානාත්මක තීරණයක් ලබාදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටී.

ඉහත කරුණු හා අංක 327/2015 දරන ගරු ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය සැලකිල්ලට ගෙන ගරු බේරුම්කරණයෙහි පවතින මෙම නඩුකරය අවසන් කිරීමට තීරණය කරමි.

පැමිණිලිකරුට *හෙවත්* පළමු පාර්ශ්වය ඉල්ලා සිටින සහන ලබා ගැනීමට හිමිකමක් නොමැති බවටද තීරණය කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ආචාර්ය **කේ. ඒ. තිලකරත්න**
බේරුම්කරු.

2025 අගෝස්තු මස 21 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

EOG 09- 0170

---

මගේ අංකය - IR/COM/03/2021/31

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.11.18 දිනැති හා අංක 2411/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.11.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වීරකොඩියාන, ඉහල වීරකොඩියාන, පලුගහවත්ත ලිපිනයෙහි පදිංචි ඩබ්. ඒ. ප්‍රේමසිරි මයා සහ කොළඹ 02,

සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50 ලිපිනයෙහි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/64/2024 හා 2025.08.17 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

යොමු අංකය: IR/COM/03/2021/31
නඩු අංකය: ඒ/64/2024

ඩබ්. ඒ. ප්‍රේමසිරි මයා,
පලුගහවත්ත,
පලුගහවත්ත,
ඉහළ වීරකොඩියාන,
වීරකොඩියාන

*පළමු වන පාර්ශ්වය*

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
සර් චිත්තම්පලම්,
ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02. *දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ ප්‍රදානය**

2025 අගෝස්තු මස 17 වැනි දින දීය.

අධිකරණ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පළාත් පාලන හා කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත

මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඇය වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩාමාදුව, ද විලේජ් අංක 202/බී/61 හි පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිලාගේ ජයවික්‍රම වන මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වූ කරුණ වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අංක IR/COM/03/2021/31 හා 2024.10.28 දිනැති ලිපියෙහි දන්වා ඇත්තේ " ලංකා විදුලි බල මණ්ඩලයේ සේවය කළ ඩබ්. ඒ. ප්‍රේමසිරි මහතා වැඩ තහනමට ලක් වී සිටි කාලසීමාව සඳහා එනම් 1990.04.16 දින සිට 1991.04.19 වන " දින දක්වා හා 2002.11.13 දින සිට 2006.09.18 දින දක්වා කාලසීමාවන් සඳහා ඔහුට හිඟ වැටුප් සඳහා හිමිකමක් තිබේ ද හිමිකමක් තිබේ නම් එය නොගෙවීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද ද යන්නත් පිළිබඳව වේ.

මෙම ආරාවුල සම්බන්ධව 2024.12.18 දින සිට 2025.05.30 දින දක්වා අවස්ථා 05 කදී දෙපාර්ශ්වය නාරාහේන්පිට කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශයට කැඳ වූ අතර පළමු දිනයේ හැර සෙසු දිනවලදී පළමු වන පාර්ශ්වය සහභාගී වූ අතර දින සියල්ලේම දෙවන පාර්ශ්වය සහභාගී විය. දෙපාර්ශ්වයේම නීතිඥවරුන් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව අවසන් විභාග දිනයේදී ප්‍රකාශ කළ නමුත් දෙපාර්ශ්වයටම සාධාරණයක් ඉෂ්ඨ කිරීම සඳහා ලිඛිත දේශනයක් ඇත්නම් 2025.06.11 වන දින පස්වරු 4.00 ට පෙර බේරුම්කරණ අංශයට ගොනු කරන ලෙස දන්වා සිටි අතර පසුව එය 2025.06.30 දක්වා දීර්ඝ කරනු ලැබිය. මෙම බේරුම්කරණ විභාගය ආරම්භ කළ 2024.12.18 වන දින පළමු පාර්ශ්වයේ පෙනී නොසිටි නමුත් 2025.01.23 වන දින ඔහු පෙනී සිටින ලදී.

ප්‍රථමයෙන්ම පළමු වන පාර්ශ්වයේ ඉල්ලීම පරිදි ඔහුගේ නම ඩබ්. ඒ. ප්‍රේමසිරි නොව වේරගොඩ ආරච්චිගේ ප්‍රේමසිරි යනුවෙන් නිවැරදි විය යුතු බව සිය හැඳුනුම්පත ඉදිරිපත් කරමින් පළමු වන පාර්ශ්වය කියා සිටි අතර ඒ අනුව ඔහුගේ නම ඩබ්. ඒ. ප්‍රේමසිරි වශයෙන් සංශෝධනය කරමි.

අනතුරුව දෙපාර්ශ්වයටම මෙම බේරුම්කරණ විභාගය පැවැත්වෙන ආකාරය මා විසින් පැහැදිලි කර දුනිමි. ඒ අනුව ප්‍රථමයෙන්ම කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දී ඇති මෙම කාර්මික ආරාවුල අදාළ යොමුව කියවා දුන් අතර එය නිවැරදි බව පළමු වන පාර්ශ්වකරු පිළිගන්නා ලදි. අනතුරුව මෙම විභාගය මාස 03 ක් තුළ නිම කිරීමට අපේක්ෂා කරන බවත් මෙම ආරාවුල සම්බන්ධයෙන් වෙනත් අධිකරණයක නඩුවක් පවතින්නේ දැයි විමසූ විට නඩුවක් නොමැති බව දෙපාර්ශ්වයම කියා සිටි අතර මෙම බේරුම්කරණ විභාගය අවසානයේදී කිසියම් පාර්ශ්වයක් මූල්‍යමය සහනයක් අපේක්ෂා කරන්නේ නම් ඒ සම්බන්ධව ලිඛිතව ඉදිරිපත් කළ යුතු බව ද පැහැදිලි කර දුනිමි. මෙම විභාගයේ සාක්ෂි විමසීම විධිමත් අධිකරණයකදී මෙන් සිදු නොවන නමුත් දෙපාර්ශ්වයටම තමන් ඉදිරිපත් කරන කරුණු දිවුරුම් ප්‍රකාශ මගින් හෝ ලිඛිත දේශන මගින් හෝ අදාළ ඇමුණුම් සමග ලේඛන ගොනු කළ හැකි බව දෙපාර්ශ්වයටම පැහැදිලි කර දුනිමි.

මෙම කාර්මික ආරාවුලට හේතුව වශයෙන් පළමු වන පාර්ශ්වකරු 2025.02.10 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් කියා සිටියේ තමා 1985.10.31 වන දින සේවක අර්ථ සාධක අරමුදල් අංක 17838 යටතේ කාර්යාල කාර්ය සහයක ලෙස සේවයට බැඳී පසුව අයපත්කරු ලෙස උසස්වීම් ලබා 2017.12.03 වන දින සේවයෙන් විශ්‍රාම ලැබූ බවයි. වර්ෂ 1990 දී රාජකාරි කටයුත්තක් නොවන සාපරාධී චෝදනාවක් සම්බන්ධයෙන් එනම් මිනී මැරීමේ චෝදනාවක් සම්බන්ධයෙන් 1990.04.09 වන දින අත්අඩංගුවට ගත් බවත් 1990.10.25 වන දින දක්වා රිමාන්ඩ් බන්ධනාගාර ගතව සිට ඇප මත නිදහස් වූ බවත් ඇප මත නිදහස් වීමෙන් පසු 1991.04.19 දින නැවත සේවයේ පිහිට වූ බවත් කියා සිටී. අනතුරුව කොළඹ මහාධිකරණය විසින් නඩු අංක 7963/96 යටතේ අධි චෝදනා ලබා දී අදාළ නඩු විභාගයෙන් අනතුරුව තමා එකී අපරාධය සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇත. ඒ අනුව 2002.11.13 වන දින සිරගත කර ඇති අතර එම හේතුව මත රාජකාරි වැඩ තහනම් කරනු ලැබ ඇත. අනතුරුව පළමු වන පාර්ශ්වකරු තමා විසින් අභියාචනාධිකරණයට CA/160/161/2002 යටතේ අභියාචනයක් සිදුකර ඇති අතර අභියාචනාධිකරණය විසින් 2006.05.03 වන දින සිය තීන්දුව ලබා දෙමින් පළමු වන පාර්ශ්වකාර වේරගොඩ ආරච්චිගේ ප්‍රේමසිරි යන තමා සියලු චෝදනාවලින් නිදහස් කර ඇත. ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් පළමු වන පාර්ශ්වකරු තම 2006.09.18 වන දින නැවත සේවයේ පිහිටවූ බව කියා සීටී.

නැවත සේවය පිහිටුවීමෙන් පසු තමා සිරගතව සිටි කාලයද තම සේවා කාලයට එකතු කර ඇති නමුත් තමා සිරගතව සිටි කාලයට අදාළ හිඟ වැටුප් නොගෙවූ බවත් හිඟ වැටුප් ඉල්ලා සිටි අවස්ථාවලදී ලංකා විදුලි බල මණ්ඩලයේ විනය නීති සංග්‍රහය අනුව හිඟ

වැටුප් ගෙවීමේ හැකියාවක් නොමැති බව දක්වමින් තමන්ට හිඟ වැටුප් නොගෙවූ බවත් ඒ සම්බන්ධයෙන් පළමු වන පාර්ශ්වකරු තමා විසින් කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට පැමිණිලි කළ බවත් දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් ගේ අංක CS/COA/B/4/2028/19 හා 2020.01.11 දිනැති ලිපියෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ සමාන්‍යාධිකාරි වෙත දන්වා ඇත්තේ තමාගේ හිඟ වැටුප් වර්ධක ගෙවා නොමැති නම් එම ලිපියේ දින සිට දින 30ක තුළ ගෙවා නිම කරන ලෙසත්ය. ඒ අනුව තමන්ට හිඟ මුදල් නොලැබුණ හෙයින් මෙම ආරාවුල බේරුම්කරණ අංශයෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරණ අංශයට යොමු කර ඇති බව පළමු පාර්ශ්වකරු කියා සිටී.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වකාර ලංකා විදුලි බල මණ්ඩලය නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ සහය ඇතුව 2025.03.20 දිනැති පිළිතුරු ප්‍රකාශයේ කියා සිටින්නේ පළමු වන පාර්ශ්වකරු 2017.12.03 වන දින විශ්‍රාම යන ලද බව පිළිගන්නා බවත් විශ්‍රාම වැටුප් සකස් කිරීමේ දී වැඩ තහනම්ව සිටි සම්පූර්ණ කාලය වන අවුරුදු 4 යි මාස 11 යි දින 3 1/2 ක කාලය අඩුකර විශ්‍රාම වැටුප සකස් කළ බවයි. පළමු වන පාර්ශ්වකරු සාපරාධී චෝදනාවක් සම්බන්ධයෙන් 1990.04.16 දින බන්ධනාගාර ගත වීමෙන් පසු ඇප මත නිදහස් ලැබීම හේතුවෙන් 1991.04.18 දින සිට නැවත සේවයේ පිහිටුවන ලද නමුත් ඔහු සේවයට වාර්තා කරනු ලැබුවේ 1991.04.26 වන දින බවත් කියා සිටී. පළමු වන පාර්ශ්වකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමක් නැවත සේවයේ පිහිටුවීමෙන් අනතුරුව සේවයට වාර්තා කිරීමට ප්‍රමාද වීමත් හේතුවෙන් වැඩ තහනම්ව සිටි සම්පූර්ණ කාලය අවුරුදු 4 මාස 10 දින 22 ක් බව ද කියා සිටී.

දෙවන පාර්ශ්වය වැඩිදුරටත් කියා සිටින්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ විනය කාර්ය පටිපාටියේ 16.4,16.7 (ඇ) වගන්තිය හා 16.1 (අ) වගන්තිය සමග 16.2 වගන්තිය අනුව කටයුතු කළ බවත් ඒ අනුව වැඩ තහනම්ව සිටි කාලයට අදාළ I පාර්ශ්වකරුට කිසිදු හිඟ වැටුපක් නොගෙවන ලද බවත්ය.

2025.03.20 වන දින මෙම බේරුම්කරණ විභාගයේ පළමු වන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි ඔහුගේ නියෝජිත මහතා කියා සිටියේ අභියාචනාධිකරණ තීරණය මත ඔහු නැවතත් සේවයේ පිහිටු වීමට ලංවීම සමාන්‍යාධිකාරි කටයුතු කර ඇති අතර ලංවීමේ විනය කාර්ය සංග්‍රහයේ 16.7 සහ ලංවීම විනය සංග්‍රහයේ 10.12 යටතේ ඔහුට සම්පූර්ණ වැටුප් ගෙවිය යුතු බවත් ඊට අමතරව ආයතන සංග්‍රහයේ 7 වන පරිච්ඡේදයේ 8 උපවගන්තිය යටතේ ප්‍රතිපාදන අනුව රඳවා ගන්නා ලද පඩි නඩි ඔහු වෙත ගෙවිය යුතු බවත්ය.

ඉදිරිපත් වූ ලිඛිත දේශන ඇමුණුම් හා වාචික සාක්ෂි අනුව බේරුම්කරු වශයෙන් පහත නිරීක්ෂණයන් කරමි.

ලංකා විදුලි බල මණ්ඩලයට සෘජුවම සම්බන්ධ නොවන මිනී මැරුම් චෝදනාවක් හේතුවෙන් රක්ෂිත බන්ධනාගාර ගත කොට ඇප මත නිදහස් වීමෙන් පසුව හෝ මහාධිකරණය මගින් වරදකරු කර සිරදඬුවම් ලබා දී පසුව අභියාචනාධිකරණය විසින් සියලු චෝදනා වලින් නිදහස් කිරීමෙන් අනතුරුව නැවත සේවයේ පිහිටුවා ඇති නමුත් පළමු වන පාර්ශ්වකරු සම්බන්ධව අභ්‍යන්තරමය වශයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවයි. අවම වශයෙන් රක්ෂිත බන්ධනාගාර ගතකොට සිට ඇප මත නිදහස් වීමෙන් පසුව ඔහුගෙන් නිදහසට කරුණු විමසීමක් සිදුකර අවශ්‍ය නම් මූලික විමර්ෂණයක් පැවැත්වීමට කාලය තිබුණි. වර්ෂ 2019 සිට 2022 දක්වා වසර 3 ක කාලය මූලික විමර්ෂණයක් පවත්වා විධිමත් විනය පරීක්ෂණයක් වුව ද පැවැත්වීමට ප්‍රමාණවත් කාලයකි. නමුත් ලංකා විදුලි බල මණ්ඩලය එවැන්නක් සිදු කර නොමැත. එය ප්‍රබල පරිපාලනමය දෝශයක් වශයෙන් සලකමි.

ඒ සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ලංකා විදුලි බල මණ්ඩලයේ විනය නීති සංග්‍රහයේ ප්‍රතිපාදන නොමැත්තේ නම් එවැනි අවස්ථාවක ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අදාළ කර ගත හැකි බවට ලංකා විදුලි බල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.10.10 දිනැති අයිතම අංක 16.14.248 දරන අධ්‍යක්ෂ මණඩල පත්‍රිකාව මගින් 2018.06.25 වන දින සිට බලපැවැත්වෙන පරිදි විනය නීති පටිපාටියේ අතිරේකයක් අනුමත කර නිකුත් කර ඇත. එහි " විනය කටයුතු සිදු කිරීමේදී මෙම නීති (ලංවීම විනය නීති පටිපාටිය) මගින් සපයා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී සහ / හෝ අපහැදිලි තැන්වලදී විනය කටයුතු නිසි පරිදි කිරීම සඳහා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ගයක් ලෙස ආයතන සංග්‍රහයේ අදාළ ප්‍රතිපාදන අනුගමනය කළ යුතු ය" යනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. ඉහත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය තිබිය දී දෙවන පාර්ශ්වය විසින් 2025.03.20 වන දින මෙම බේරුම්කරණ විභාගයට ගොනු කරන ලද පිළිතුරු ප්‍රකාශයේ 10(3) යටතේ දක්වා ඇත්තේ "කිසිදු අවස්ථාවකදී ආයතන සංග්‍රහයේ 7 වන පරිච්ඡේදයේ 7.8 වගන්තිය දෙවන පාර්ශ්ව ආයතනයේ විනය කෘත්‍යන් සම්බන්ධයෙන් අදාළ නොවන බවයි. දෙවන පාර්ශ්වයේ එම ප්‍රකාශය නොමඟ යවන සුළු සහ ලංකා විදුලි බල මණ්ඩලයේ අධ්‍යක්ෂ තීරණවලට පටහැනි බව නිරීක්ෂණය කරමි "

ලංකා විදුලි බල මණ්ඩලයේ විනය නීති රෙගුලාසි යටතේ ඇති ප්‍රතිපාදනත් ආයතන සංග්‍රහයේ විනය රෙගුලාසි යටතේ වන ප්‍රතිපාදනත් සැලකීමේදී අධිකරණමය ක්‍රියා මාර්ගයක් ගෙන තිබීම, අභ්‍යන්තරික විනය පරීක්ෂණයක් පැවැත්වීමට කිසිදු බාධාවක් නොවේ. ලංකා

විදුලි බල මණ්ඩලයේ විනය නීති රෙගුලාසි අනුව අධිකරණමය කටයුත්තක තීන්දුව මත විනය ක්‍රියා මාර්ග ගතහැකි බවට ප්‍රතිපාදනයක් නොමැති වුවද ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන උපයෝගී කරගත හැකිය. ආයතන සංග්‍රහයේ II වන කොටසේ ඉතා පැහැදිලිව දක්වා ඇත්තේ විනය බලධාරියාට නැවත අභ්‍යන්තර විනය පරීක්ෂණයක් නොපවත්වා අධිකරණ තීරණය මත විනය ක්‍රියාමාර්ග ගත හැකි බවයි. එම ප්‍රතිපාදනය ද පළමු වන පාර්ශ්වකරුට අදාළ වේ. ලංකා විදුලි බල මණ්ඩලයේ විනය නීති රෙගුලාසි වල 16.7 (i) ඡේදය අනුවත් ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ (28.3) අනුවත් අධිකරණමය කටයුත්තෙන් චූදිත නිලධාරි නිදහස් වන්නේ නම් ඔහු වැඩ තහනම්ව සිටි කාලයට රඳවා ගෙන සිටි වැටුප්, උසස් වීම් සහ අනෙකුත් දීමනා ගෙවිය යුතුයි.

අධිකරණමය ක්‍රියාමාර්ගයකින් වරදකරු කරනු ලැබුවහොත් එම චූදිත නිලධාරියාට හෝ නිලධාරිනියට දඬුවම් කරන අතර ඔහුගේ හෝ ඇයගේ වැටුප් නොගෙවා අත්හිටුවීම නිවැරදි ය. නමුත් අධිකරණමය ක්‍රියාමාර්ගයෙන් චූදිත නිලධාරි නිදහස් වන්නේ නම් හෝ නිදොස් කොට නිදහස් වන්නේ නම් එහි දී ඔහු වැඩතහනම්ව සිටි කාලයට අදාළ වැටුප්, උසස්වීම් සහ අනෙකුත් දීමනා රඳවා තබා ගැනීමේ අයිතියක් හෝ හිමිකමක් කිසිදු ආයතනයකට නොමැත. අභ්‍යන්තර විනය පරීක්ෂණයක් නොමැති අවස්ථාවක අධිකරණය මගින් පුද්ගලයෙකු නිදහස් කිරීමෙන් පසු තවදුරටත් ඔහුගේ හිඟ වැටුප් නොගෙවෙන්නේ නම් චූදිත වරදකරු කිරීමේත් නිවැරදිකරු බවට ප්‍රකාශ කිරීමේත් අවසන් ප්‍රතිඵල එකක් වේ. එවැන්නක් කිසිසේත්ම සාධාරණ හා යුක්ති සහගත නොවේ. ඒ අනුව මෙම බේරුම්කරණ විභාගයේ බේරුම්කරු වශයෙන් මගේ ප්‍රදානය පහත පරිදි ලබා දෙමි.

ගරු අභියාචනාධිකරණය මගින් පළමු වන පාර්ශ්වකරු අදාළ සාපරාධී ක්‍රියාව සම්බන්ධව ඔහුට ලබාදුන් මහාධිකරණ දඬුවම ඉවතලා නිදහස් කර ඇති බැවින් ඔහු එම මෙහොතේ සිට නිවැරදි පුද්ගලයෙකු බවට පත්වේ. ඒ අනුව පළමු වන පාර්ශ්වකරුට ලංකා විදුලි බල මණ්ඩලයේ විනය නීති සංග්‍රහයේත් ආයතන සංග්‍රහයේ විනය නීති රෙගුලාසි යටතේ ඇති ප්‍රතිපාදන අනුව අභියාචනාධිකරණයෙන් පළමු වන පාර්ශ්වකරු නිදහස්කොට ඇති බැවින් රාජකාරී වැඩ තහනම්ව සිටි කාලයේ හිඟ වැටුපට හිමිකම් ලබයි. පළමු වන පාර්ශ්වකරුගේ රාජකාරී වැඩ තහනම්ව සිටි 1990.04.16 දින සිට 1991.04.19 දක්වා හා 2022.11.03 දින සිට 2006.09.18 දක්වා වූ කාලයට පමණක් හිඟ වැටුප් සඳහා හිමිකම්ක් ලබයි. නමුත් දෙවන පාර්ශ්වය 2025.03.20 දින ගොනු කළ මූලික ප්‍රකාශනයේ II ඡේදය අනුව අවු. 04 මාස 11 දින 3 1/2 වැටුප රඳවාගෙන ඇති බව ප්‍රකාශ කර ඇත. බේරුම්කරු වශයෙන් මගේ ඉල්ලීම පරිදි බේරුම්කරණ අංශයේ සහකාර කොමසාරිස් විසින් ලංකා විදුලි බල මණ්ඩලයෙන් කරන ලද ලිඛිත ඉල්ලීම පරිදි එලෙස රඳවාගෙන ගෙන ඇති හිඟ වැටුප රුපියල් පන් ලක්ෂ හැට දහස් දෙසිය තිස් නවයයි ශත තිස් තුනක් (560239.33) බවත් වැටුප් රහිත නිවාඩු සඳහා අය කිරීම රුපියල් එක්දහස් හත්සිය හැටහයයි ශත හතලිස් දෙක (1766.42) බව ලංකා විදුලි බල මණ්ඩලයේ නීති නිලධාරිගේ අංක : එ/64/2024 හා 2025.08.01 දිනැති ලිපියෙහි දන්වා ඇත. ඒ අනුව දෙවන පාර්ශ්වකාර ලංකා විදුලි බල මණ්ලය විසින් පළමු පාර්ශ්වකරුගේ රඳවා ගෙන ඇති මුළු වැටුප වන රුපියල් පන් ලක්ෂ හැට දහස් දෙසිය තිස් නවයයි ශත තිස් තුන (560239.33) ක මුදල එකවර ගෙවිය යුතු බවට වැඩිදුරටත් නියම කරමි. එම වකවානුවට අදාළ වෙනත් දීමනා සහ ව්‍යවස්ථාපිත හිමිකම් වේ නම් ඒවාද උසස්වීම් වේ නම් ඒවාද හිමි විය යුතු බව වැඩිදුරටත් තීරණය කරමි.

පළමු වන පාර්ශ්වකරු මෙම ප්‍රදානය ලබා දෙන දිනට වසර හත හමාරකට පෙර විශ්‍රාම ගොස් තිබීමත් ඔහු දැරූ තනතුරත් හේතුවෙන් හා මෙම විභාගය පවත්වන අවස්ථා වන විට හෘද රෝගියෙකු බවට පත් ව සිටීම හේතුවෙන් තමන්ට ලැබිය යුතු හිඟ වැටුප ගණනය කර ඉදිරිපත් කිරීමට නොහැකිවීම සාධාරණ කරුණක් වශයෙන් පිළිගනිමි. එම නිසා පළමු වන පාර්ශ්වයෙන් හිඟ මුදල පිළිබඳව ලිඛිත ඉල්ලීමක් නොලද වුව ද දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළ රඳවා ගත් වැටුප සම්බන්ධ වූ ලේඛනය මත පළමුවන පාර්ශ්වකරුට හිමි විය යුතු හිඟ වැටුප තීරණය කළෙමි. ඒ අනුව පළමුවන පාර්ශ්වකරුට හිමි විය යුතු හිඟ වැටුප වන රුපියල් පන් ලක්ෂ හැට දහස් දෙසිය තිස් නවයයි ශත තිස් තුනක් (560239.33) වන මුදල හා ඔහුට හිමි විය යුතු වෙනත් ව්‍යවස්ථාපිත දීමනා තිබේ නම් ඒවා සියල්ල මෙම බේරුම්කරණ ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් තුළ දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියම කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

**ඩබ්. ඒ. ජයවික්‍රම**
බේරුම්කරු.

EOG 09- 0171

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.